**ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය නොකළ මතය**

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අප්‍රේල් 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ,
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි,
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම,
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| චක්‍රලේඛයේ 7(v) ඡේදය ප්‍රකාරව ශුද්ධ වත්කම් ගණනය කරන ආකාරය දක්වා තිබුණද ඒ අනුව ගණනය කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුළු වත්කම් හා මූල්‍ය වගකීම් අතර රු.288,600 ක වෙනසක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කිරීමෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ නිවැරදිතාවය තහවුරු කර ගැනීම අවශ්‍ය වේ. | වගකීම් වශයෙන් බාහිර පාර්ශව වෙත ගෙවීමට තිබූ (ඉදිකිරීම් 5% රඳවා ගැනීම) රු.288,600 ක මුදල එකම ආකෘති පත්‍රයෙහි ස්ථාන දෙකක දැක්විය යුතු වුවත් එක් ස්ථානයක පමණක් එම මුදල සටහන් කිරීම හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇති අතර, ඉදිරියේ දී නිවැරදිව ගණනය කිරීම් සිදු කර ඉදිරිපත් කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. |

### 1.6.2 මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඒසීඒ 6 - මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගැනීම් මඟින් අත්පත්කර ගැනීම් එකතුව රු.17,313,411 ක් වූ අතර එය ඒසීඒ - 2(i) වැඩසටහන යටතේ වියදම් ප්‍රකාශයේ දක්වා තිබුණු මූලධන වත්කම් අත්පත්කර ගැනීමේ වියදම වූ රු.17,189,254 සමඟ එකඟ නොවීම හේතුවෙන් රු.124,157 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාල වන අනෙකුත් වාර්තාවල ඇතුළත් සංඛ්‍යාවන් සැසඳීමට පියවර ගැනීම අවශ්‍ය වේ. | මිලදී ගනු ලැබූ විෂයන්හි තිබූ අඩුපාඩු මත වගකීම් කාලය තුළ දී ආපසු භාර දීමටත්, ගණනය කිරීමේ දෝෂ වැය ලෙජරයේ නිවැරදි ලෙස සකස් කර ඇති අතර, එම අවලංගු කරන ලද විෂයන් හි වටිනාකම සිගාස් වැඩසටහන යටතේ ඉවත් නොවීම මත මෙම වෙනස සිදු වී ඇති අතර, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ සිගාස් වැඩසටහන් සමග සම්බන්ධ වී ඉදිරියේදි එය නිවැරදි කිරීමට කටයුතු කරන බැව් දන්වා සිටිමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1** **වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථානයේ පිහිටි භුක්තිය නිසි පරිදි පවරාගෙන නොතිබුණු ඉඩමෙහි පැරණි ගොඩනැගිලි 29 ක අළුත්වැඩියා කටයුතු සඳහා, රු.1,310,000 ක මුදලක් හා නව ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රු.399,500,000 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණු බව නිරීක්ෂණය විය. | වැලිගම ප්‍රාදේශීය ලේකම්ගේ 2016 ජූනි 01 ලිපියට අනුව 14 වන පරිශිෂ්ඨය මඟින් භුක්තිය මෙතෙක් පවරාදීමක් සිදුකර නොමැති බැවින් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදුකළ නොහැක. | විනාශ වී තිබුණු ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව රාජකාරී කටයුතු සිදුකරන ලද අතර පැවරී ඇති රාජකාරී කටයුතුවල ස්වභාවය හා වර්ධනය හේතුවෙන් පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සිදුකරන ලදී. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් හලාවත ප්‍රදේශයේ පිහිටි ඉඩම් හෙක්ටයාර 0.9482 ක් විධිමත් පවරා ගැනීමකින් තොරව පරිහරණය කරන බව නිරීක්ෂණය විය. | අදාල වත්කම් කඩිනමින් පවරා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. | මානුෂීය මෙහෙයුම් පැවති සමයේ නාවික හමුදාව විසින් ඉටුකළ ඇතැම් රාජකාරී වර්තමානයේ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන බැවින් එම කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා නාවික හමුදාපතිගේ ලිපි මඟින් පවරා දීමට අනුමැතිය ලබා දී ඇති බවත් ඒවායේ භුක්තිය නිසි පරිදි දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අදාල රාජ්‍ය ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇති බවත් දන්වා ඇත. |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට අයත් එකතුව හෙක්ටයාර් 2.1374 ක් වූ ඉඩම් විධිමත් පවරා ගැනීමකින් තොරව පරිහරණය කර | අදාල වත්කම් කඩිනමින් පවරා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. | මෙම ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා සිදුකළ යුතු මිනුම් හා නිෂ්කාශන කටයුතු මේ වන විට අවසන් වී ඇති නමුත් තවමත් නිසි ආකාරයෙන් පවරා දී |

| | | |
|---|---|---|
| තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එකතුව රු.52,327,020 ක්වූ වියදමක් දරා එම ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | | නොමැති බව දන්වා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) වගන්තිය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව අවස්ථා 09 කදී රු.6,031,034 ක් වටිනා වත්කම් හා තොග විෂයයන් මිලදී ගෙන ඇති බව නිරීක්ෂණය විය. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) ප්‍රකාරව මිලදී ගැනීම් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමෙන් අනතුරුව භාණ්ඩ මිලදී ගැනීම අවශ්‍ය වේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති පරිදි විෂයයන් ඉල්ලුම් කිරීමේදී ඇස්තමේන්තුගත මුළු පිරිවැය නියමිත පරිදි සටහන් කිරීමට කටයුතු කරන ලෙස අදාල ආයතන, අනුබණ්ඩ, නෞකා/ යාත්‍රා සහ සැපයුම් දෙපාර්තමේන්තුවේ විෂය භාර නාවිකයින් දැනුවත් කරන ලදී. |
| (ආ) නිශ්චිත දිනයන් රහිතව එළඹ තිබුණු ගිවිසුම් මත අවස්ථා 02 කදී රු.1,143,260 ක් වටිනා වත්කම් හා තොග විෂයයන් මිලදී ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | විධිමත් ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව තොග විෂයයන් මිලදී ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් අනුව, අදාල ගිවිසුම්වල ආයතනික පිටපතේ දින යෙදීමෙන් නිවැරදි කළ හැකි වුවත්, සැපයුම්කරුගේ පිටපත නිවැරදි කිරීමට අපහසුවනු ඇත. | විගණනය මඟින් පෙන්වා දී ඇති ලිපිගොනු දෙකෙහි අතපසුවීමකින් අදාල දිනය යෙදීමට නොහැකි වී ඇති බවත් අතපසුවීම් නිවැරදි කිරීම සඳහා අදාල ගිවිසුම් අත්සන් කරන ලද නියමිත දිනය එම ගිවිසුම් දෙකෙහි සටහන් කිරීමට කටයුතු කළ අතර මින් ඉදිරියට මෙවැනි අතපසුවීම් සිදුනොවීම සඳහා විෂයභාර නාවිකයින් දැනුවත් කරන ලදී. |
| (ඇ) ඉදිරිපත් කර තිබුණු ලංසුවට අත්සන් තබා නොතිබීමේ හේතුව මත ලංසු ඇගයීමේ | අත්සන් නොකර ඉදිරිපත් කළ ලංසු ජාතික ප්‍රසම්පාදන | විගණනය මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව සැපයුම්කරුවන් හා විෂය භාර |

| | | |
|---|---|---|
| අවස්ථාවේ ඒවා ප්‍රතික්ෂේප නොකර අවස්ථා 02 කදී වටිනාකම රු.1,236,044 ක් වූ තීන්ත වර්ග මිලදී ගෙන තිබුණු බව නියැදි විගණනයේදී අනාවරණය විය. | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව විශාල අඩුපාඩුවක් බැවින් ඇගයීමට භාජනය නොකර ප්‍රතික්ෂේප කළ යුතු වේ. | නාවිකයින් දැනුවත් කිරීමට කටයුතු කරන ලද අතර අත්සන් නොකරන ලද ලංසු තවදුරටත් ඉදිරිපත් කෙරේ නම් ඒවා ප්‍රතික්ෂේප කිරීමට උපදෙස් ලබාදෙන ලදී. |

**3.2 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | --------------- | -------------------------------- |
| (අ) | දෙපාර්තමේන්තුව විසින් නේවාසිකාගාර හා පරිපාලනමය කටයුතු සඳහා යොදා ගැනීමට ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම සඳහා 2016 අගෝස්තු මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කර තිබුණද, 2017 ජූලි මස 19 වන දින පැවැත්වූ ආර්ථික කළමනාකරණ අමාත්‍ය මණ්ඩල කමිටු රැස්වීමේදී මෙම ගොඩනැගිලි 02 ක ඉදිකිරීමේ කටයුතු අත්හිටුවා තිබුණි. මේ නිසා රු.14,645,183 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීමේ විෂයයන් භාවිතයට ගෙන ගොඩනැගිලි අත්තිවාරම පමණක් ඉදිකර තිබුණ අතර රු.22,173,438 ක් වටිනා අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය අදාල පරිශ්‍රය තුළ අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. | වර්ෂ 02 කට ආසන්න කාලයක් ගතවී ඇති බැවින් ප්‍රසම්පාදනය කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයට ගැනීමට හෝ අපහරණය සඳහා පියවර ගත යුතුය. | විගණනය මඟින් පෙන්වා දී ඇති පරිදි ආර්ථික කළමනාකරණ කැබිනට් කමිටු රැස්වීමේදී මෙම ගොඩනැගිලි දෙකෙහි ඉදිකිරීම් කටයුතු අත්හිටුවා ඇති අතර, මෙම ඉදිකිරීම් සඳහා ප්‍රසම්පාදනය කරන ලද ගබඩා විෂයයන් සඳහා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් කරුණු විමසීමෙන් පසු ගබඩා භාණ්ඩ හඳුනාගැනීම, ලැයිස්තු සකස් කිරීම සහ තක්සේරු කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇත. ඒ අනුව ඉතිරි ගබඩා විෂයයන් සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනයට ගත් CG410 යාත්‍රාව 2018 දෙසැම්බර් 31 දින වන විටත් අවු.02 මාස 02 ක කාලයක් මුළුල්ලේ අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | අදාල යාත්‍රා කඩිනමින් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම අවශ්‍ය වේ. | ආඥාපති නැගෙනහිර නාවික පෙදෙසගේ දිකාස 281543 මාර්තු 2019 දරන සංඥාව මගින් පෙන්වා දී ඇති අලුත් වැඩියාවන් ඉදිරියට පවතින අතර, ඉන් අනතුරුව මෙහි මුහුදු ධාවන පිරික්සුම් සඳහා සුදානම් කරනු ලැබේ. |

**3.3** **පාඩු හා හානි**

---------------

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| ඇණවුම් කළ භාණ්ඩ ප්‍රමාද වී සපයා තිබුණු අවස්ථා 04 කදී රු.327,720 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර නොගෙන ගෙවීම් කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන කටයුතුවලදී ප්‍රමාද වී සපයන ඇණවුම් සඳහා ප්‍රමාද ගාස්තු අය කරගෙන ගෙවීම් කළ යුතුය. | ඇණවුම් කරන ලද භාණ්ඩ ප්‍රමාද වී සැපයුම් කිරීම සම්බන්ධව අදාල සැපයුම්කරුවන් දැනුවත් කර එම ප්‍රමාද ගාස්තු කඩිනමින් ගෙවීමට කටයුතු කරන ලෙස ලිපි මඟින් දැනුවත් කර ඇති අතර මින් ඉදිරියට ප්‍රමාද වී විෂයයන් සැපයුම් කරන අවස්ථා සඳහා අයකරගත යුතු මුදල් අයකර ගැනීමෙන් පසුව ප්‍රේෂණ පත් ලබාදීමට කටයුතු කරන ලෙස අදාල අංශ දැනුවත් කරන ලදී. |

**3.4** **කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 8.4 ක් වැයකර ඉදිකර තිබුණු මිරිස්ස මළ අපද්‍රව්‍ය පවිත්‍රාගාරය සම්බන්ධයෙන් මූල්‍ය හා තාක්ෂණික කරුණුවලට අදාලව සක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිලියෙළ කළයුතු වුවත්, එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමෙන් පසුව ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතු වේ. ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ඇත්නම් එම වාර්තාව ලිපිගොනුවට ඇතුලත් කල යුතු වේ. | පවිත්‍රාගාරය ඉදිකිරීමට ප්‍රථම මූල්‍ය හා තාක්ෂණික කරුණුවලට අදාලව සක්‍යතා අධ්‍යන වාර්තාවක් ලිපිගොනුව තුළ නොමැති වුවද, ඒ සඳහා කරන ලද තාක්ෂණික කමිටු වාර්තාවේ සඳහන් පරිදි එවකට සිටි ඉංජිනේරු නිලධාරි විසින් සක්‍යතා අධ්‍යනයක් සිදුකර ඇති බව සඳහන් වේ. |
| (ආ) උක්ත පවිත්‍රාගාරය සම්බන්ධයෙන් 2016 අගෝස්තු 03 දිනැති අධ්‍යක්ෂ ඉංජිනේරුගේ ලිපියට අනුව, ඉදිරිපත් කරන ලද මිල කියුමේ තාක්ෂණික යෝජනාවේ දක්වා ඇති පරිදි සම්පූර්ණ ධාරිතාවය සහිතව මෙම යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා දිනකට වැය වන විදුලිය ඒකක ප්‍රමාණය කිලෝවොට් පැය 25 වුවත් ක්‍රියාත්මක කිරීමේ දී විදුලි | අධ්‍යක්ෂ ඉංජිනේරුගේ වාර්තාව ලබා දී වර්ෂ 03 කට ආසන්න වී ඇත. සැපයුම්කාර ආයතනයට එරෙහිව ක්‍රියාමාර්ග අප්‍රමාදව ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. | විෂයගත කරුණු සම්බන්ධව අදාල සේවා නියෝජිත සමාගම දැනුවත් කිරීමට කටයුතු කළද, එම ආයතනය විසින් මේ සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බැවින්, එකී සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල ලිපිගොනුව වෙරළ ආරක්ෂක නීති නිලධාරී වෙත යොමුකොට ඇත. |

| | | | |
|---|---|---|---|
| | ඒකක කිලෝවොට් පැය 50 වැය වන බව නිරීක්ෂණය විය. ඒ අනුව ලංසුව සමඟ ඉදිරිපත් කර තිබුණු යෝජනාවට වඩා මාසික විදුලි වියදම දෙගුණයක් වන බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | උක්ත පවිත්‍රාගාරයෙන් පිටවන ජලය මාස 03 කට වරක් හෝ මධ්‍යම පරිසර අධිකාරිය අනුමත ප්‍රමිතියන්ට අනුකූලව තිබෙන බවට පරීක්ෂණාගාර සහතිකයකින් පසු පරිසරයට මුදාහැරිය යුතු වුවත් පවිත්‍රාගාරය ස්ථාපිත කළ 2016 මැයි 12 දින සිට 2018 දෙසැම්බර් 31 දින වනවිටත් එවැනි පරීක්ෂණ සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒවාට අදාල ප්‍රමිතීන්ට අනුව කටයුතු කළ යුතුය. | විගණනය මගින් පෙන්වා දී ඇති පරිදි මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සම්බන්ධීකරණය වී පවිත්‍රාගාරයෙන් පිටවන ජලයෙහි ප්‍රමිතිය පිළිබඳව ඉදිරියේදී පරීක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | 2018 වර්ෂයේදී අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගලි බවුසර් යොදාගනු ලැබූ අවස්ථා 19 ක් සඳහා රු.165,300 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය වන අතර සැපයුම්කාර ආයතනය සමඟ පැන නැගී ඇති ගැටළුකාරී තත්වය හේතුවෙන් ඉදිරියේදී මෙම වියදම තව දුරටත් ඉහළ යා හැකි බව නිරීක්ෂණය විය. | අදාල යන්ත්‍රාගාරය නිසිපරිදි ක්‍රියා කරවීම තුළින් අනාර්ථික වියදම් අවම කිරීම අවශ්‍ය වේ. | මෙම සේවා සැපයුම් ආයතනය සමඟ පැණ නැගී ඇති ගැටළුකාරී තත්ත්වය සමතයකට පත්වනතුරු ආයතනය සමඟ සම්බන්ධීකරණය වී නිරාකරණය කර ගැනීමට අපහසු බැවින් ගලි බවුසර් සේවාව මේ සඳහා යොදාගැනීමට කටයුතු කරනු ලැබේ. කරුණු එසේ වුවද, අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගලි බවුසර් යොදා ගැනීමේදී අවම වාර ගණනකින් උපරිම සේවාවක් ලබාගැනීමට අදාල පාර්ශව දැනුවත් කිරීමට වැඩිදුරටත් කටයුතු කෙරේ. |